## ගෝත්‍රවාදී දේශපාලනයට තිත තැබිය යුතු කාලය ඇවිත්

# ප්‍රතිපත්තිමය දේශපාලනය සඳහා සඟරුවන සමාජයට මඟ පෙන්විය යුතුයි

## ඇමැති මිලින්ද මොරගොඩ

(රන්ජිත් ආනන්ද ජයසිංහ)

රටතුළ දැන් පවතින්නේ පටු ගෝත්‍රවාදී දේශපාලන රටාවක් බවත් මෙය වෙනස් කර වඩාත් පුළුල් ප්‍රතිපත්තිමය දේශපාලනයක් සඳහා සංඝරත්නය සමාජයට මඟපෙන්විය යුතු බවත් අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා ප්‍රකාශ කළේය.

අමාත්‍ය මොරගොඩ මහතා මෙසේ ප්‍රකාශ කළේ පාදුක්ක ගලගෙදර ගුණවර්ධනාරාම විහාරස්ථානයේදී පැවැති සංවාදශීලී ජනහමුවකදීය.

රටේ පවත්නා දේශපාලන ක්‍රමය පිළිබඳ වැඩිදුරටත් අදහස් දැක්වූ අමාත්‍යවරයා ප්‍රකාශ කළේ දැනට ක්‍රියාත්මකවන දේශපාලන ක්‍රමවේදය වෙනස් කළ යුතු කාලය එළැඹ තිබෙන බවය.

යුද්ධය හමාරවීමෙන් පසුව ශ්‍රී ලංකාවට සාමය උදාවී තිබේ. ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ මඟපෙන්වීමෙන් දැන් රටතුළ යෝධ සංවර්ධන කාර්යයන් රාශියක් ආරම්භ වී ඇත. මේ අවස්ථාව රට ගොඩ නැඟීම සඳහා උදාවී තිබෙන අනඟි අවස්ථාවකි. එහිදී මහා සංඝරත්නය ප්‍රමුඛ ආගමික නායකත්වයෙන් ලැබෙන අවවාද අනුශාසනා ඉතා වැදගත්වන බව අමාත්‍ය මොරගොඩ මහතා වැඩිදුරටත් පැවසීය.

රටේ ආර්ථිකය පමණක් සංවර්ධනය වීමෙන් යහපත් සමාජයක් නිර්මාණය නොවේ. ආර්ථික සංවර්ධනයට සමාන්තරව සමාජ සංවර්ධනයත් පුද්ගල සංවර්ධනයත් සිදුවිය යුතුය. මෙහිදී සිවිල් සමාජය හා පන්සල අතර ඇති ඓතිහාසික සබඳතාව තුළින් විපුල ඵල ප්‍රයෝජන ලබාගත හැකියැයි අමාත්‍යවරයා පෙන්වා දුන්නේය.

පුද්ගල සංවර්ධනයෙන් තොරව සමාජ සංවර්ධනයක් හෝ ජාතික සංවර්ධනයක් ගැන බලාපොරොත්තු තැබිය නොහැකිය. පුද්ගල



සංවර්ධනයෙන් සමාජය තුළ මුල්බැස ගන්නා යහපත් සිතිවිලි නඟා සමාජයේ සාරධර්ම ආරක්ෂාවන බව පෙන්වා දුන් අමාත්‍ය මොරගොඩ මහතා සංවර්ධන කාර්යය සඳහා ආගමික ශික්ෂණය අවශ්‍ය යුගයක් උදාවී ඇතැයිද ප්‍රකාශ කළේය.

අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා සමඟ පැවැති සංවාදශීලී ජනහමුවට රයිගම් හේවාගම් දෙකෝරලයේ ප්‍රධාන සංඝනායක ගොඩගම වනරතන, සියනෑ හේවාගම් දෙකෝරලයේ උප ප්‍රධාන සංඝනායක තල්දෙන ඤාණිස්සර නාහිමිවරුන් ප්‍රමුඛ මහා සංඝරත්නයද ශ්‍රී ලංකා ජාතික සංගමයේ මහ ලේකම් ආර්.ජේ.ඩී. සිරිසේන මහතාද විහාරස්ථ දායක සභාවේ නිලධාරීන් ඇතුළු පිරිසක්ද සහභාගී වූහ.